**www.wsws.org** **ලෝක සමාජවාදී වෙබ් අඩවිය**

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ලියොන් ට්‍රොට්ස්කි, සෝවියට් ඉතිහාස රචනය හා සම්භාව්‍ය මාක්ස්වාදයේ ඉරනම

## Leon Trotsky, Soviet Historiography, and the Fate of Clssical Marxism

**ඩේවිඩ් නෝර්ත්**

**2008 දෙසැම්බර් 01**

*ස්ලාවික අධ්‍යයනයේ අභිවර්ධනය සඳහා වන ඇමරිකානු සංවිධානය* (AAASS) *එහි 2008 වර්ෂයේ ජාතික සම්මේලනය නොවැම්බර් 20-23 අතර ෆිලඩෙල්ෆියාවේදී පැවැත්වීය. එහිදී කන්ඩායම් 600 කට වැඩි සංඛ්‍යාවක් ඉතිහාසය, දේශපාලන විද්‍යාව, සාහිත්‍ය, භාෂාව හා සිනමාව පිලිබඳ මාතෘකා 1,700 ආවරනය කරමින් ලියවිලි ඉදිරිපත් කලහ. වටමේස සාකච්ඡා පැවැත්වූහ. සමුලුවේ ප්‍රදර්ශන ශාලාවෙහි මේරිංග් පොත් (ප්‍රකාශකයෝ) ඇතුලු ප්‍රකාශකයන් හා සංවිධාන 50 කට වැඩි සංඛ්‍යාවක් ඔවුන්ගේ මෑත ප්‍රකාශන ප්‍රදර්ශනය කලහ.*

*සමුලුවේ උච්ච අවස්ථාවක් වූයේ, "ලියොන් ට්‍රොට්ස්කිගේ බුද්ධිමය හා දේශපාලන උරුමය" වෙනුවෙන් කැපවුනු කන්ඩායම් සාකච්ඡාවයි. ස්වාධීන ශාස්ත්‍රඥයෙකු වන ලාර්ස් ලින් එහි ප්‍රධානත්වය දැරූ අතර ජෙරුසලමේ හීබෘ විශ්වවිද්‍යාලයේ බරක් නේයි පැෂ්, ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කතෘ මන්ඩලයේ සභාපති ඩේවිඩ් නෝර්ත් හා සෙන්ට් පීටර්ස්බර්ග් හි ස්වාධීන විද්වතෙකු වන ව්ලැඩිමීර් වොල්කොව් වැඩමුලුවට ලියවිලි තුනක් ඉදිරිපත් කලහ. සහභාගිත්වය සතුටුදායක විය. හතලිස් දෙනෙක් ඉදිරිපත් කරන ලද ලිපිවලට අවධානයෙන් යුතුව ඇහුන්කන් දුන්හ. නේයි පැෂ්,* The Social and Political Thought of Leon Trotsky *(ලියොන් ට්‍රොට්ස්කිගේ සමාජ හා දේශපාලන චින්තනය) යන තම ග්‍රන්ථය පිලිබඳ 30 අවුරුදු ප්‍රත්‍යවලෝකනයක් ඉදිරිපත් කලේය. ඩේවිඩ් නෝර්ත්,* Leon Trotsky, Soviet Historiography, and the Fate of Classical Marxism *(ලියොන් ට්‍රොට්ස්කි, සෝවියට් ඉතිහාස රචනය හා සම්භාව්‍ය මාක්ස්වාදයේ ඉරනම) යන මැයෙන් ඊට හාත්පසින්ම වෙනස් පර්යාලෝකයක් ඉදිරිපත් කලේය. අපි එය සම්පූර්නයෙන්ම මෙහි පහතින් පලකරමු. වොල්කොව්,* The Reception of Trotsky's Legacy in Russia from Perestroika to the Present *(ට්‍රොට්ස්කිගේ දායාදය කෙරෙහි රුසියාව තුල දැක්වෙන ආකල්පය පෙරෙස්ට්‍රොයිකාවේ සිට වර්තමානය දක්වා) පිලිබඳ විමර්ෂනයක් කලේය.*

*පැය දෙකක සැසියෙන් ඉතුරුවූ කාලය තුල පැවති සාකච්ඡාව උද්යෝගිමත් එකක් විය. එක් ප්‍රශ්න අසන්නෙක්, 1917 ඔක්තෝබර් විප්ලවයේ චිරකාලීන උරුමය කෙරේ අවධානය යොමු කලේය.*

*ලෙනින්ගේ මරනයෙන් පසු අවධියේ ට්‍රොට්ස්කිගේ ප්‍රතිපත්ති ආධිපත්‍යය දැරුවේ නම්, විසිවන සියවසේ ඉතිහාසය කෙලෙස වෙනස්විය හැකිව තිබුනේ දැයි තවත් ප්‍රශ්නයක් අසනලදී. සංකීර්න ඓතිහාසික ප්‍රයුක්තීන් පරීක්ෂා කර බලන කල්හි විකල්පයන් සැලකිල්ලට ගැනෙන හෙයින් ඉතිහාසඥයන්ගේ කර්තව්‍යයන් පිලිබඳව වෙනස්වන මත සැලකිල්ලට භාජන කරන ලදී.*

*නෝර්ත්ගේ ලේඛනය 2008 නොවැම්බර් 21 ඉදිරිපත් කල ආකාරයෙන් පහත පලකරන අතර, සාකච්ඡාවේදී මතුවූ කරුනු පිලිබඳ වැඩිදුර විශ්ලේෂන මතුවට ඉදිරිපත් කරන්නෙමු.*

★★★

අයිසැක් ඩොයිස්චර් විසින් රචිත, *The Prophet Armed,* සන්නද්ධ අනාගත වක්තෘ, *The Prophet Unarmed,* නිරායුධ අනාගත වක්තෘ හා *The Prophet Outcast.* පිටුවහල්ගත අනාගත වක්තෘ යන ට්‍රොට්ස්කි පිලිබඳ ත්‍රිත්ව චරිතාපදානයේ අවසන් වෙලුම ප්‍රකාශයට පත්කිරීමෙන් පසුව වසර 45 කට වඩා ගතවී ඇත. එතරම් ගැඹුරු හා දුර දිග යන බුද්ධිමය හා දේශපාලන බලපෑමක් ඇතිකල වෙනත් චරිතාපදානයක් ගැන සිතාගැනීමටත් අපහසුය. 1950 ගනන් මුල් භාගයේදී ඩොයිස්චර් ඔහුගේ කාර්යය අරඹන විට ට්‍රොට්ස්කි මියගොස් වසර 10 ක් ගතවී තිබුනි. එහෙත් ඔහුගේ ඝාතකයා වූ ජෝසෆ් ස්ටැලින්, සෑම කොමියුනිස්ට් පක්ෂයකම සහායෙන් පවත්වා ගෙන යනු ලැබූ මහජන භක්ත්‍යාදරය ඔහුට ලබාදීමේ පිලිකුල් විකාර ව්‍යායාමයකට පාත්‍රවෙමින් ක්‍රෙම්ලිනයේ ජීවත්විය. ඩොයිස්චර්, චරිතාපදාන කතුවරයෙකු ලෙස තම කර්තව්‍යය තෝමස් කාලයිල් සමඟ සැසඳුවේය. තමාට ග්‍රේට් ප්‍රොටෙක්ටර් හෙවත් මහා රක්ෂකයා -

ක්‍රොම්වෙල්ගේ නිල තනතුර - "බලු කුනප කන්දකින්, මහා අවලාද කන්දරාවකින්, සහ අන්ධකාරයෙන් ද, එලියට ඇද ගැනීමට සිදුවී යයි" ඔලිවර් ක්‍රොම්වෙල් පිලිබඳ සිය අධ්‍යයනයේදී කාලයිල් දෝෂාභිමුඛයෙන් සඳහන් කර තිබේ. (1)

1963 වසරේ ඔහුගේ තුන්වන වෙලුම සම්පූර්න කරන විට දේශපාලන වට පිටාව යසරඟට වෙනස්වී තිබුනි. 1953 මාර්තුවේදී ස්ටැලින් මිය ගොස් තිබුනි. 1956 පෙබරවාරි මස පැවැත්වුන සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ 20 වන සමුලුවේ දී කෘෂෙව් ඔහුගේ ඊනියා "රහස් දේශනය" පවත්වා තිබුනි. ස්ටැලින් වූ කලී 1930 ගනන්වල විරේක තුලින් ගනන් නැති පැරනි බොල්ශෙවිකයන් හා භක්තිමත් කොමියුනිස්ට්වාදීන්, හිරකිරීමට, වධ බන්ධනයට ලක්කිරීමට හා මරා දැමීමට වගකිවයුතු දේශපාලන අපරාධකරුවෙකු යයි කෘෂෙව් ඔහු හෙලා දැකීමේ මුවවිටටම පැමිනියේය. සැබවින්ම ස්ටැලින්ගේ අපරාධවල මුලු පරිමාවම කෘෂෙව් පිලිගත්තේ නැත. ඔහුගේ දෝෂාරෝපනය අසම්පූර්න මෙන්ම මගහරිනසුලු විය. එහෙත් කෘෂෙව්ගේ කථාවේ ප්‍රතිවිපාක දේශපාලනිකව ස්ටැලින්වාදයට විනාශකාරී විය. ස්ටැලින්ගේ අපරාධ හෙලිදරව් කිරීම තුලින් ගලා ආ අප්‍රකාශිත එහෙත් අනිවාර්ය නිගමනය වූයේ 1936-38 කාලයේ මොස්කව් නඩු, ගොතන ලද අවනඩු බවත්, පැරනි බොල්ශෙවික් විත්තිකරුවන් නීති විරෝධී ලෙස මරාදමනලද බවත්, ය. "ට්‍රොට්ස්කි නිවැරදිය" යන සිතුවිල්ල, සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ හා එයට අනුබද්ධ ලෝකය පුරා ස්ටැලින්වාදී පක්ෂවල ගනන් නැති නායකයන් හා සාමාජිකයන් පසු පස හොල්මන් කලේය. මොස්කව් නඩු සම්බන්ධයෙන් ට්‍රොට්ස්කි නිවැරදි වූයේ නම් තවත් කෙතරම් ප්‍රශ්න සම්බන්ධයෙන් ඔහු නිවැරදි වන්නට ඇද් ද?

අවුරුදු 30ක් ගතවීමට පෙර ඒවායේ බිඳී යාමට මග හෙලිකල අභ්‍යන්තර දේශපාලන කුනුවීමට මුල පුරමින්, ස්ටැලින්වාදී පක්ෂ විදාරනය කල ආරවුල මධ්‍යයේ, ඩොයිස්චර්ගේ ත්‍රිභාග චරිතාපදානය දැවැන්ත දේශපාලන අර්ථභාරයක් ගැබ්කර ගත්තේය. ස්ටැලින් වැරදිකරුවෙකු ලෙස එලිදරව් වීම, බොහෝ දුරට ට්‍රොට්ස්කි නිදොස් වීමක් විය. එකල පැවති වාතාවරනය තුල රූපකව ඉස්මතු කරන ලද ට්‍රොට්ස්කිගේ වීරෝදාර ස්වරූපය, අතිශයෝක්තියක් ලෙස කෙසේවත් පෙනීගියේ නැත. විශේෂයෙන්ම, ඩොයිස්චර් ට්‍රොට්ස්කි සමග පැවති සිය අතීත දේශපාලන මතභේද ප්‍රකට ලෙස ගෙනහැර දක්වා තිබුනු තුන්වන වෙලුම තුල ඩොයිස්චර්ගේ සැලකිය යුතු සීමාසහිතකම් තිබියදී වුවත්, දේශපාලනිකව පෙරලිකාරී වූ බුද්ධිමතුන්ගේ හා තරුනයන්ගේ නව පරපුරකට ශ්‍රේෂ්ඨ විප්ලවවාදියෙකුගේ වීරෝදාර පෞරුෂය හඳුන්වා දීමට වෙලුම් තුන හේතු කාරක විය. එය මොන තරම් නම් පෞරුෂයක් වී ද? මෙතරම් බුද්ධිමය, දේශපාලනික, සාහිත්‍යමය හා මිලිටරි නිපුනතා සම්භාරයක් දරා සිටියේ ඉතිහාසයේ වෙන කවර පුද්ගලයා ද? ට්‍රොට්ස්කිගේ ජීවිතයට නාටකීය භාවයක් ආරෝපනය කිරීමට අවශ්‍ය වූයේ නැත. ඔහුගේ ජීවිතය ම රුසියානු විප්ලවය නමැති මහා ඓතිහාසික ඛේදාන්ත නාටකයේ සංකේන්ද්‍රිත ප්‍රකාශනයක් නොවී ද?

1960 වන විට සෝවියට් සංගමය, බුද්ධිමතුන් හා සිසුන්ගේ පරිකල්පනය කෙරේ සිය ආකර්ෂනය නැති කරගෙන තිබුනි. ට්‍රොට්ස්කි පිලිබඳ ඩොයිස්චර්ගේ චරිතාපදානය, ට්‍රොට්ස්කිගේ කෘතීන් බලගතු ක්‍රියාකලාපයක් ඉටුකල 1920 ගනන්වල පැරනි මතභේද යලි හඳුන්වාදීම සඳහා උපකාරී විය. එබැවින් ඩොයිස්චර්ගේ පාඨකයින් බොහෝ දෙනෙක් ඒ වන විට සුලභවෙමින් පැවති ට්‍රොට්ස්කිගේ ලේඛන අධ්‍යයනය සඳහා මං පාදාගත්තේය.

1960 ගනන් පුරා ද 1970 ගනන්වල ද ට්‍රොට්ස්කිගේ ජීවිතය හා ඔහුගේ වැඩකටයුතු පිලිබඳ උනන්දුව ඉමහත් විය. 1978 ඔහුගේ උපන් දින ශත සංවත්සරය ආසන්නයේදී මහාචාර්ය බරුක් නේයි පැජ් *The Social and Political Thought of Leon Trotsky* (ලියොන් ට්‍රොට්ස්කිගේ සමාජ හා දේශපාලන චින්තනය) යන කෘතිය ප්‍රකාශයට පත්කලේය. සිය විෂය කෙරේ නේයි පැජ්ගේ ප්‍රවිෂ්ටය මතභේදාත්මක වුවත්, ට්‍රොට්ස්කි වනාහී වැදගත් දේශපාලන හා "බුද්ධිමය" පෞරුෂයක් වී යයි සෝවියට් ශාස්ත්‍රාලිකයන් අතර පැවති ප්‍රමුඛ හැඟීම එය පිලිබිඹු කලේය. ට්‍රොට්ස්කි, "සමහර විට අහේතුකව නොව අද දිනයේ පවා, විප්ලවකාරී පුද්ගලයන් හිඟ නොවූ යුගයක සිටි ශ්‍රේෂ්ඨතම විප්ලවවාදියා ලෙස සැලකිය යුතු යයි" නේයි පැජ් සටහන් කලේය. "න්‍යාය හා අදහස් ක්ෂේත්‍රයේ ට්‍රොට්ස්කිගේ ජයග්‍රහන සුවිසල් යයි" පැවසීය. 20 වන සියවසේ පසුගාමී රටවල සමාජ පරිවර්තනය විග්‍රහ කල ප්‍රමුඛයන් අතර ඔහු වීය. එසේම, මෙවැනි වෙනස්කම් වලින් මතුවිය හැකි දේශපාලන ප්‍රතිවිපාක විස්තර කිරීමට උත්සාහ කල ප්‍රමුඛයන් අතර ද ඔහු වීය. (2) මාක්ස්වාදියෙකු හා ට්‍රොට්ස්කිගේ දේශපාලන සංකල්පයන්හි අනුගාමිකයෙකු වන මා (ඩේවිඩ් නෝර්ත්) ගෞරවයෙන් යුතුව නොඑකඟ වන අංග මහාචාර්ය නේයි පැජ්ගේ බොහෝ විශ්ලේෂන හා අර්ථ කථනයන්හි පවතී. එහෙත් ඔහුගේ සුපරීක්ෂ විද්වත්භාවය විසින් සහතිකෙන්ම විදහා දක්වා ඇත්තේ ට්‍රොට්ස්කිගේ ජීවිතය වනාහී බරපතල පර්යේෂනයන්ට උචිත ක්ෂේත්‍රක් බවය. ට්‍රොට්ස්කි ක්‍රියාකාරි පුද්ගලයකු වශයෙන් අති විශිෂ්ඨයෙකු වුවා පමනක් නොව ඔහු අසාමාන්‍ය චින්තකයෙකු ද විය. හාවඩ් විශ්ව විද්‍යාල ලේඛනාගාරයේ තැන්පත් කර ඇති අතිමහත් ලේඛන

සම්භාරයෙන් තොරව වුව ට්‍රොට්ස්කිගේ ලේඛන තනි මුද්‍රනයක් ලෙස ගතහොත්, ඝන වෙලුම් හැට හැත්තෑවක් වනු ඇතැයි මහාචාර්ය නේයි පැෂ් තක්සේරු කරයි. (3)

තම අධ්‍යයනය සඳහා නිශ්චිත සීමාවන් මහාචාර්ය පැෂ් විසින්ම පනවාගෙන තිබේ. ට්‍රොට්ස්කිගේ ජීවිතය හා ඔහුගේ යුගය වැනි පලල් හා සංකීර්න විෂයක් සමඟ පොරබැදීමට වැර දරන ශාස්ත්‍රඥයෙකුට මෙය අත්‍යවශ්‍යය. මෙම කෘතියේ විෂය ක්ෂේත්‍රය ට්‍රොට්ස්කිගේම චින්තනයට සීමාවන අතර, ඔහුගේ විරුද්ධවාදීන්ගේ හෝ අනුගාමිකයන්ගේ කෘතීන් පිලිබඳව හෝ ඔහුගේ නම සමඟ අනන්‍ය වන්නාවූ දෘෂ්ටිවාදාත්මක හා දේශපාලන ව්‍යාපාරය පිලිබඳ අධ්‍යයනයක් නොවන බවත් නේයි පැෂ් පැහැදිලි කර තිබේ. (4) මෙම විනයගත සීමාව සමඟ වුව ද පැෂ්ගේ පැවරුම සම්පූර්න කිරීමට ක්ලැරන්ඩන්ප්‍රෙස් මුද්‍රනාලයේ සූක්ෂම අකුරුවලින්  මුද්‍රිත පිටු 598 ක් අවශ්‍ය විය. එසේවුවද නේයි පැෂ්, ශාස්ත්‍රීය ප්‍රජාවට වාද කිරීමට තවත් බොහෝ ඉඩ තබා ඇතුවා පමනක් නොව, බොහෝදේ කිරීමට ද ඉඩ හැර තිබේ.

එසේ වුව ද නේයි පැෂ්ගේ කෘතිය, ට්‍රොට්ස්කි පිලිබඳ විෂය ක්ෂේත්‍රයට මෙතෙක් කරන ලද සැබෑ අධ්‍යාපනික වටිනාකමකින් යුත් එකතුකිරීම් වලින් වැදගත්වූ අවසාන එක ය. තත්වය එසේ වෙතැයි 1978 දී පෙර දැකීම අපහසු විය. නේයි පැෂ්ගේ කෘතිය එලිදක්වන ලද්දේ ට්‍රොට්ස්කි අධ්‍යයනයන් ධෛර්යමත් කිරීමට තුඩුදිය යුතුව තිබුනු සිද්ධියක මුවවිටදීය. එම සිද්ධිය නම් 1980 ජනවාරි 02 දා හාවඩ් විශ්ව විද්‍යාලයේ හව්ටන් පුස්තකාලයෙහි මීට පෙර වසා තිබූ ට්‍රොට්ස්කිගේ ලේඛනාගාරයේ කොටසක් විවෘත කිරීමයි. ඒ වනතුරුම ට්‍රොට්ස්කිගේ වැන්දඹු බිරිඳ වූ නටාලියා සෙඩෝවාගේ විශේෂ අනුමැතියකින් තොරව ඒ මහා විප්ලවවාදියාගේ පෞද්ගලික ලේඛන සම්භාරයට පිවිසීමට හැකියාවක් තිබුනේ නැත. එම අනුමැතිය ලැබූ එකම ලේඛකයා වූයේ අයිසැක් ඩොයිස්චර්ය. එහෙත් පෙනීගිය ආකාරයට, මෙම ලේඛනාගාර විවෘත කිරීම, සෝවියට් ඉතිහාස ක්ෂේත්‍රය පිලිබඳ ඇමරිකානු හා බ්‍රිතාන්‍ය පරියේෂකයන් කෙරේ ඇති කලේ සුලු බලපෑමක් පමනි. පසුගිය 28 වසර තුල ප්‍රකාශයට පත්වූ ශාස්ත්‍රීය අධ්‍යයනයන් සඳහා මෙම දැවැන්ත ලේඛනාගාරයෙන් ප්‍රයෝජන ගෙන ඇත්තේ මඳ වශයෙනි.

1978න් පසුව ට්‍රොට්ස්කි අධ්‍යයනය මෙසේ මැලවී යාම කුතුහලය දනවන සංසිද්ධියකි. 1980 පුරාම සෝවියට් සංගමයේ හා නැගෙනහිර යුරෝපයේ ගැඹුරු වෙමින් පැවති අර්බුදය ට්‍රොට්ස්කිගේ ලේඛන පිලිබඳව වඩා සියුම් පුනරීක්ෂනයක් නිශ්චිතවම යුක්ති යුක්ත නොකලේ ද? ස්ටැලින් හා ස්ටැලින්වාදයේ හා බුද්ධිමතුන්ගේ ප්‍රමුඛතම විවේචකයා වූයේ ට්‍රොට්ස්කි නොවේ ද? සෝවියට් සංගමයේ අභාවය පෙරදැක තිබුනේ ඔහුය. 1990 මුල් භාගයේදී යෙල්ට්සින්ගේ අනුග්‍රහය යටතේ සෝවියට් සංගමය තුල ආර්ථික ප්‍රතිගමනයට මඟපෑදූ ධනවාදය පුනස්ථාපනය කිරීමේ ක්‍රියාදාමය, ට්‍රොට්ස්කි කල්තියාම *The Revolution Betrayed* (විප්ලවය පාවාදීම) නම් 1936 දී ලියන ලද සිය කෘතිය තුල නිවැරදිව චිත්‍රනය කර තිබුනි. කරුනු එසේ වුව ද ඉතිහාසය, ආර්ථික විද්‍යාව, දේශපාලනය හා සෝවියට් සංගමයේ සමාජ ව්‍යුහය සම්බන්ධව ඉංග්‍රීසි භාෂාවෙන් රචිත බොහෝ ලේඛනවල ට්‍රොට්ස්කි සුලු වූ ද පසෙකින් සිටියාවූ ද අයෙකු ලෙස දිස්වෙයි. යුද මූලෝපායඥයෙකු ලෙස ට්‍රොට්ස්කිගේ ක්‍රියාකලාපය පිලිබඳව ජයග්‍රහන වෙත අවධානය යොමුකල *Leon Trotsky and the Art of Insurrection* (*ලියොන් ට්‍රොට්ස්කි හා නැගිටීමේ කලාව*) නමැති මෙම කෘතිය 1980 ගනන්වල, සෝවියට් ඉතිහාසයේ එතරම් කැලඹිලි සහගත දශකයක, ට්‍රොට්ස්කි අධ්‍යයනයට කැපවූ එකම සැලකිය යුතු හා ස්වතන්ත්‍ර රචනය විය. පුදුමයකට මෙන් එහි කතෘ වූයේ එක්සත් ජනපද හමුදා අභ්‍යාස විද්‍යාලයේ නිලධාරියෙකු හා මහාචාර්ය වරයෙකු වූ කර්නල් හැරල්ඩ් විල්සන් ය.

මොනවා වුවත් 1990 ගනන් දශකය පුරාම ට්‍රොට්ස්කි අධ්‍යයනය හීනවී ගියේය. ඇමරිකානු හා බ්‍රිතාන්‍ය විද්වත්හු මෙම ක්ෂේත්‍රයෙහිලා කිසිදු වැදගත් දෙයක් ඉටුකලේ නැත. සමහර විට කුඩා දෙයින් වුවත් වෙනස් ලෙස කැපී පෙනෙන එකම ප්‍රකාශිත කෘතිය එඩින්බර්ග් යුනිවර්සිටි ප්‍රෙස් මුද්‍රනාලය මඟින් 1992 දී පලකල *The Trotsky Reappraisal* (ට්‍රොට්ස්කි යලි අගැයීම) නම් රචනාවයි. මෙම දශකය තුල පැරනි ප්‍රතිට්‍රොට්ස්කිවාදී අවලාද ප්‍රතිචක්‍රීය කිරීම හා නීත්‍යානුකූල කිරීමේ සිත් සසල කරන ප්‍රවනතාවක් බ්‍රිතාන්‍ය තුල මතු විය. එයට හොඳම නිදසුන නම් ග්ලාස්ගෝ විශ්ව විද්‍යාලය විසින් පල කෙරුනු *Journal of Trotsky Studies* Bkshd ට්‍රොට්ස්කි අධ්‍යයනය පිලිබඳ සඟරාවයි. එහි ප්‍රියතම තේමාව වූයේ ට්‍රොට්ස්කිගේ ලියවිලි ආත්මසේවී විකෘතිවලින් පිරී තිබුනු බව පෙන්නුම් කිරීමයි. ඉහත චෝදනාව පුනරුච්චාරනය කෙරුනේ සත්‍ය වාර්තා මුලුමනින්ම නොතකා හරිමිනි. එය ජපකෙරුනේ සත්‍ය කරුන පිලිබඳ වාර්තාවට කිසිදු තැකීමකින් තොරවය. ට්‍රොට්ස්කි සිය *History of the Russian Revolution* (රුසියානු විප්ලවයේ ඉතිහාසය) යන කෘතිය තුල ඔක්තෝබර් විප්ලවයේදී තමන් ඉටුකල භූමිකාව විශාල වශයෙන් අතිශයෝක්තියට නංවා ඇතැයි කියාපෑ ලිපියක් එම ප්‍රතිපදානයන් අතර වඩාත් විකාර සහගත වූ එක විය. එයට අනුව ස්ටැලින් වැනි බැරෑරුම් විප්ලවවාදීන් මහ බරට කරගසන්නට පාරට බැසගෙන සිටි අතර තරමක් ඔලුව අවුල් කරගත් ට්‍රොට්ස්කිට

ඉතුරු වූයේ ස්මෝල්නි ආයතනයේ රැඳීසිට දුරකථන ඇමතුම් වලට පිලිතුරු සැපයීම ය. වාසනාවකට මෙන් මෙම සඟරාව කලාප හතරකට පසු මලේය.

වර්තමාන දශකය තුල ද මේ තත්වය වෙනස් වූයේ නැත. නව ට්‍රොට්ස්කි චරිතාපදාන දෙකක් 2003 දී හා 2006 දී පල කෙරිනි. පලමුවැන්න ඉයන් තැචර් විසිනුත් දෙවැන්න ජෙෆ්රි ස්වේන් විසිනුත් රචිතය. එම කෘතිවල කිසිදු නව පරියේෂනයක් ඇතුලත් නොවේ. *ලියොන් ට්‍රොට්ස්කි හා ඓතිහාසික මුසාකරනයේ පශ්චාත් සෝවියට් ගුරුකුලය* (5) යන විස්තෘත විවරනයේදී ඔවුන්ගේ කෘති දෙක මම දැනටමත් සවිස්තරව විභාගකර ඇත්තෙමි. (5)

ට්‍රොට්ස්කි කෙරේ දැනට පවත්නා අල්ප අවධානය ස්ටැලින් පිලිබඳව ලියවී තිබෙන ඉමහත් ලේඛන සම්භාරය සමඟ ප්‍රතිසන්දනය කර ගැනීම වටනේය. ඔහු (ස්ටැලින්) ඉතිහාසඥයින් තුල අනන්ත මනමෝහනයක් ජනනය කර ඇති සෙයක් පෙනී යයි. හිට්ලර්ට නොඅඩුව ස්ටැලින් ද ශාස්ත්‍රීය පර්යේෂන උදෙසා සුජාත විෂයයක් බව සැබෑය. ඓතිහාසික අධ්‍යයනයන් සඳහා යෝග්‍ය හෝ අයෝග්‍ය විෂයයන් ඇත්තේ නැත. ඔස්කාර් වයිල්ඩ් නවකථාවක් පිලිබඳව කර ඇති සඳහන මෙහිදී වලංගුය. නවකතා ලිවීම සඳහා මෙන්ම ඉතිහාසය ලිවීම සඳහා ද කොන්දේසි විරහිතව අවශ්‍යවන දෙය නම් එය ඉතා හොඳින් කිරීමයි, ස්ටැලින් පිලිබඳ ලේඛනයන්ගේ බොහොමයක් පිලිබඳ ගැටලුව නම් ඒවා නරකට ලියා තිබීමයි. සෝවියට් පුරාලේඛන ප්‍රයෝජනයට ගනිමින් ලියා ඇති ඒවායින් බොහොමයක් නිර්ලජ්ජිතවම පුවත්පත් කලානුරූපව ලාබ හැඟීම් අවුස්සන ඒවාය. රඩ්ෂින්ස්කි, සෙබග් මොන්ටිෆිඩ්රේ මෙම වර්ගයට උදාහරන වෙයි. වඩාත් සිත් කරදර කරන්නේ, ස්ටැලින් හා ස්ටැලින්වාදය පුනස්ථාපනය කිරීමට සැබවින්ම උත්සුක විද්වතුන් විසින් ලියන ලද අධ්‍යයනයන්ය. ඇතැම් විට මෙවන් ඉතිහාසඥයින් ලඟාවන නිගමන සැබවින්ම විකාරය. නිදසුනක් වශයෙන් මහාචාර්ය ස්ටීවන් කොට්කින් ගේ *Magnetic Mountain* (අයස්කාන්ත පර්වතය) නම් කෘතිය ස්ටැලින්වාදය වනාහී බුද්ධිප්‍රබෝධයේ ව්‍යාපෘතියේ මුදුන්පත් වීමයයි තර්ක කරයි.

.... ස්ටැලින්වාදය වනාහි (18 වන සියවස පුරා පැතිර පැවති) බුද්ධිප්‍රබෝධයේ මනෝරාජ්‍යයයේ පරම සාක්ෂාත් වීමකි; එය වනාහී රාජ්‍යය උපකරනය කොට ගෙන සමාජය තර්කානුකූලව ප්‍රතිසංවිධානය කිරීමකි; ඒ සමඟම, 19 ශතවර්ෂයේ කාර්මික කරනය විසින් ජනනය කෙරුනු පන්ති බෙදීම් ජයගැනීමට ද දැරුනු ප්‍රයත්නයකි. එම ප්‍රයත්නය ම ගත් කල මුල්බැස තිබුනේ බුද්ධිප්‍රබෝධය පැනනැගීම සක්‍යකලා වූ නාගරික රූපාකාර සාමාජීයව යොමු වූ මනෝරාජ්‍යයන් තුල ය. මැග්නිටෝගෝර්ස්ක් (අයස්කාන්ත පර්වතය-1930 ගනන්වල රුසියාවේ පිහිටුවන ලද දැවැන්ත කාර්මික සංකීර්නය) පිලිබඳ සංකල්පය ගැඹුරට මුල් ඇද තිබුනකි. (6)

මෙම ප්‍රවනතාවයේ නරකම දෙය වන්නේ ඓතිහාසික සිදුවීම් පිලිබඳව සියුම්ව වෙනස්වූ තක්සේරුවක වේෂයෙන් ස්ටැලින් සහ ඔහුගේ අපරාධ ගැන ඉදිරිපත් කරන විකාර සාධාරනීකරනයයි. යේල් යුනිවසිටි ප්‍රෙස් මුද්‍රනාලය මඟින් 1996දී ප්‍රකාශයට පත්කල රොබට් ඩබ්ලිව්. තර්ස්ටන්ගේ *Life and Terror in Stalin's Russia 1934-1941*, (1934-41 ස්ටැලින්ගේ රුසියාව තුල ජීවිතය හා භීෂනය) යන කෘතියෙහි ස්ටැලින්ගේ චෝදක නිලධාරියාවූ අන්ද්‍රෙයි විෂින්ස්කි පිලිබඳව මෙවැනි අගැයීමක් ඉදිරිපත් කෙරෙයි.

"මෙලෙස 1936 දී ඇරඹුනු ප්‍රදර්ශක නඩුවලදී ඔහුගේ බියජනක කාර්යභාරය තිබියදීම විෂින්ස්කි, 1935-36 සමයේ නීති පටිපාටිවල ප්‍රමුඛ වර්ධනයන් යෝජනා කලේය. ඊට සමගාමීව ඔහු ප්‍රධාන එන්කේවීඩී (සෝවියට් රහස් පොලීසිය) භාවිතාවන් හෙලා දුටු අතර රාජ්‍ය ප්‍රතිපත්තිවලට මූලික බලපෑමක් නොකෙරෙනතාක් දුරට සාමාන්‍ය පුරවැසියන්ගේ විවේචන කෙරේ වඩාත් ඉවසිලි සහගත විය යුතුයයි ද ඉල්ලා සිටියේය. (7)

1936 නඩුවේදී කමනෙව්, සිනොවියෙව් හා අනෙකුත් විත්තිකරුවන් ගැන සඳහන් කරන තර්ස්ටන්, ස්ටැලින් විසින් ඔවුන්ට මරන දඬුවම පැනවීම සුජාතකරනය කරන්නේ පහත සඳහන් ඉතා තුනී ලෙස සැඟවුන ආකාරයකටය.

"මේ මිනිසුන් කර තිබෙන්නේ දේශපාලන වෙනස්කම් ගැන කථා කිරීමට වැඩි නොවන වරදක් බව බොහෝදුරට පෙනෙන්නට තිබුනු බැවින් බටහිර ප්‍රමිතීන්ට අනුව නම් දඬුවමට ලක්විය යුතු නැත. එහෙත් ඔවුන් විරුද්ධවාදී වැඩකටයුතුවල නිමග්නව සිට තිබේ. ඔවුන් ට්‍රොට්ස්කි සමඟ සම්බන්ධකම් පවත්වා තිබුනු අතර රහස් ලියවිලි බටහිරට හෙලිකර ඇත. ඔවුන්ට ස්ටැලින් ඉවත් කිරීමට අවශ්‍යව තිබුනු බව පෙනේ. තම පක්ෂපාතිත්වය ප්‍රකාශයට පත්කරන අතරම ඔවුහු, ඉහත කී කාරනා සම්බන්ධයෙන් බොරු කීහ. මෙම කරුනු ස්ටැලින්ගේ ශාංකාකුල මනසට කාරනා සම්පාදනය කලේය. මේ මිනිසුන් බොරු කියන්නේ ඇයි? ඔවුන් වැනි තවත් කී දෙනෙක් සිටියෝ ද? ඔවුන්ගේ සැබෑ අරමුනු කවරක් වී ද? ට්‍රොට්ස්කි සමඟ පෙරමුන හා රියුටින් වාර්තාවේ භාෂාව සලකන කල ස්ටැලින් තරම් භීතියෙන් උමතු නොවූ කෙනෙකුට පවා එවක සිදුවූ බොහෝ කාර්මික අනතුරුවලින්

සමහරක් භීෂන ක්‍රියාවන් ලෙස දැකගැනීමට අමාරු වනු නැත. ඔහු කරුනු බොහෝ දුරට අතිශයෝක්තියට නගාගත්තා පමනක් නොව තෙමේම මහා මුසාවාද නිර්මානය කිරීම ද කලේය. එහෙත් මේ දැන් අප ඉදිරිපත්කල සාක්ෂිවලින් යෝජනා කෙරෙන්නේ ස්ටැලින් තමාව නොමග යැව්වාවූ ද තම පරම සතුරාවූ ට්‍රොට්ස්කි සමග කුමන්ත්‍රනය කලාවූ ද පුද්ගලයින් අතුගා දැමීමට පියවර ගත් බවය. අසාධාරනවූ නමුත් මෙම තීන්දුව දේශපාලන භීෂනයක් නිර්මානය කිරීමේ සැලැස්මක කොටසක් වූයේ යයි කිව නොහැකිය." (8)

ස්ටැලින් කර්මාන්තය සෝවියට් අධ්‍යයන ක්ෂේත්‍රයේ දිගටම පැවති උත්සුකයක් බව පෙනීයන අතර ට්‍රොට්ස්කි පිලිබඳ අධ්‍යයනය දිගින් දිගටම හීනවී ගියේ ය. මෙය, ට්‍රොට්ස්කිගේ ජීවිතය පිලිබඳ පර්යේෂන ඉතා අඩු පහත් මට්ටමක පැවතීම පමනක් නොව වාම විරුද්ධ පාර්ශවයේ ඔහුගේ දේශපාලන සගයන් පිලිබඳව සැලකිය යුතු පර්යේෂන නොමැතිවීම ද විසින් පෙන්නුම් කෙරෙයි. ක්‍රිස්ටියන් රකොව්ස්කි හා ඇඩොල්ෆ් යොෆගේ පටන් වාම විරුද්ධ පක්ෂයේ නායකයෝ කී දෙනෙක් පිලිබඳ සම්පූර්න අධ්‍යයනයන් ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශිත වීද? චරිතාපදාන වලට විෂය වූවෝ ද? ස්මීර්නොව්, ස්මිල්ගා, බොගොස්ලාව්ස්කි, ටෙර් වැගනියන් හා වොරන්ස්කි පිලිබඳව ලියා ඇත්තේ කුමන කෘතීන් ද? මේවනතුරුම වාම විරුද්ධ පාර්ශවය හා එහි ක්‍රියාකාරිත්වය පිලිබඳ කිසිම අංගසම්පූර්න අධ්‍යයනයක් කර නොමැත. මහා භීෂනය පිලිබඳව බොහෝ සමකාලීන කෘතීන්හි නිරන්තරව දක්නට ලැබෙන තේමාවක් නම්, ට්‍රොට්ස්කිට එරෙහි මර්දනය සමග එයට මොනම සම්බන්ධයක් වත් නොතිබින. 1930 ගනන්වල ට්‍රොට්ස්කි සෝවියට් සංගමය තුල කිසිදු බලපෑමකින් තොර වී යයි ද මේවායේ සඳහන්ය. එහෙත් එය සැබෑවටම සත්‍යය ද? වාම විපාර්ශිකයන්ගේ ක්‍රියාකාරකම් පිලිබඳ කුමන පර්යේෂනයක්වත් කර තිබේ ද? ස්ටැලින්ගේ මර්දනය ක්‍රමානුකූල උද්සෝෂනයකට පැවති ඉඩ අවුරාලුයේ වී නමුත් ට්‍රොට්ස්කිවාදී ප්‍රකාශනය වූ වාමවිපාර්ශවයේ බුලටීනය සෝවියට් රාජ්‍යයේ හා පක්ෂ සංවිධානවල කලකිරුනු පුද්ගලයන්ගේ චින්තනය කෙරේ කිසිදු බලපෑමක් ඇති නොකලේ ද? තවද, රතු හමුදාවේ නිලධාරී මන්ඩලයේ ද, සාමාන්‍ය සොල්දාදුවන්ගේ ද අතර සිටි සිවිල් යුද්ධයේ අත්දැකීම් ලත් ප්‍රවීනයන් අතර ට්‍රොට්ස්කි පිලිබඳ මතකය මුලුමනින්ම මැකීගොස් තිබුනි ද? සෝවියට් සංගමය තුල ''ඔහු ගැන සිතීම තහනම් කල දා පටන් සෑම අයෙක්ම ඔහු ගැන සිතයි. ....වයෝවෘද්ධ මිනිසා ජීවත් වන තුරුම ජයග්‍රාහී නිලධාරී තන්ත්‍රයට ආරක්ෂාවක් නොමැතිවනු ඇතැ''යි (9) 1937 දී වික්ටර් සර්ජ් ට්‍රොට්ස්කි ගැන ලියන විට ඔහු තම කලාත්මක අවසරය නිකම්ම පාවිච්චි කලා වන්නේ ද? අවශ්‍ය පරියේෂන කෙරෙන තෙක් මෙයට පිලිතුරු දිය නොහැක.

මෙම කාර්යය මේ දක්වාම නොකෙරී ඇත්තේ මන් ද? මෙය සංකීර්න ප්‍රශ්නයකි. එක් අවස්ථාවකදී එයම බුද්ධිමතුන්ගේ, ඉතිහාසය හදාරන සිසුන්ගේ විෂයක් වනු ඇත. නිශ්චිත පිලිතුරක් ඇතැයි මම නොකියමි. අධ්‍යයන හා ශාස්ත්‍රීය ප්‍රජාව තුල ට්‍රොට්ස්කි පිලබඳ සංකල්ප හා පිලිගැනීම කෙරේ බලපෑමක් ඇතිකල හැකි කරුනු කිහිපයක් දැක්වීමට කැමැත්තෙමි. ට්‍රොට්ස්කිගේ දේශපාලන "අනදාලත්වය'' පිලිබඳව කෙරෙන නිරීක්ෂනයක් විශ්වාසනීය හෝ ප්‍රශස්ත නොවන බව මුලින්ම සඳහන් කිරීමට ඉඩ දෙන්න. ට්‍රොට්ස්කි ඉතා පැහැදිලිව 20 වන සියවසේ එක් ප්‍රධාන සංසිද්ධියක් වන රුසියානු විප්ලවයේ තීරනාත්මක භූමිකාවක් ඉටු කලේය. තවද ඔහු, සිදුවූ පරිද්දෙන්ම සියවසේ බහුශ්‍රැත පුද්ගලයන්ගෙන් කෙනෙකි. 1931 දී බර්ටෝල්ඩ් බ්‍රෙෂ්ට් "ට්‍රොට්ස්කි ශ්‍රේෂ්ඨතම ජීවමාන යුරෝපීය ලේඛකයා යයි නිගමනය කිරීමට ඇතිතරම් කරුනු තිබේය යන මතය තරයේ දරාසිටි බව" වෝල්ටර් බෙන්ජමින් ඔහුගේ දිනපොතෙහි සටහන් කර තිබේ. (10) මේ සියල්ල පෙන්නුම් කරන්නේ ට්‍රොට්ස්කි පිලිබඳ තවත් කෘතියක් යුක්තිසහගත කිරීමට ඉහත සඳහන් සුදුසුකම්ම සෑහෙන බවයි. ට්‍රොට්ස්කිගේ දේශපාලන හා බුද්ධිමය උරුමය - කෙතරම් විවාදාත්මක වුවත් කොතරම් අභියෝගයට ලක්කෙරුනත් - සමකාලීන දේශපාලනය මත අඛන්ඩව බලපාන බව නිසැක ය. පැහැදිලිවම ට්‍රොට්ස්කි ඉතිහාසයට අදාලය. එසේනම් ඉතිහාසඥයින්ට ඔහු අනදාල වන්නේ කෙසේ ද? ආසන්න වශයෙන් දශක තුනක් පැවතී තිබෙන ගතානුගතික දේශපාලන හා බුද්ධිමය වාතාවරනය, ශාස්ත්‍රීය ප්‍රජාව තුල ට්‍රොට්ස්කි පිලිගැනීම කෙරේ බලපෑ වැදගත් කරුනක්බව සඳහන් කල යුතුය. ශ්‍රේෂ්ඨාධිකරන විනිසුරුවන්ගේ සිත් තුලට ද මැතිවරන ප්‍රතිපල බලපායි. ඉතිහාසඥයෝ පුවත්පත් කියවති. 1938 දී ට්‍රොට්ස්කි විචක්ෂන ලෙස නිරීක්ෂනය කල පරිදි දේශපාලන ප්‍රතිගාමිත්වයේ බලවේග ජයග්‍රහනය අත්පත්කරගත් කල්හි ඒවා විසින් ඊත්තුගැන්වීමක් ද කරනු ලැබේ. 1991 දී සෝවියට් සංගමය විසුරුවා හැරීමත් සමග සමස්ත සෝවියට් අත්දැකීම ම තිත්ත ලෙස ප්‍රතික්ෂේප කරන්නා වූ ලියවිලි කන්දරාවක් ම පැනනැග්ගේ ය. මාටින් මාලියා, රොබට් කොන්ක්වෙස්ට්, වෙහෙස නොබලා වැඩෙහි යෙදුනු රිචඩ් පයිප්ස් හා හිටපු ස්ටැලින්වාදියෙක් වූ ෆ්‍රාන්සුවා ෆූරේ යන සමාජවාදී ව්‍යාපාරයේ දක්ෂිනාංශික විරුද්ධවාදීහු රුසියාවේ දේශපාලන උරුමය හා යුරෝපීය මාක්ස්වාදය පිලිබඳව, ගැඹුරු නොවන පර්යේෂන පවා අධෛර්යමත් කරවන හා බුද්ධිමය වශයෙන් මුග්ධ කරවන පරිසරයක් ඇති කලහ. ට්‍රොට්ස්කිට හිතවත්කම් දැක්වෙන පර්යේෂන ගැන කියනුම කවරේද?

ලියෝපෝල්ඩ් හයිම්සන්ගේ *Origins of Bolshevism* බොල්ශෙවික්වාදයේ සම්භවය, සැමුවෙල් බැරන්ගේ *Plekhanov* ප්ලෙකනෝව් හෝ මුල් කාලීන සෝවියට් ඉතිහාසය පිලිබඳ ඊ. එච්. කාර් ගේ විශ්වකෝෂමය අධ්‍යයන වැනි, 1950 හා 1960 ගනන්වල සෝවියට් අධ්‍යයනය පිලිබඳ සම්භාව්‍ය කෘතීන්, 1990 ගනන්වල ලියවෙයි ද යන්න සිතීමටත් අපහසුය. මාක්ස්වාදී හා බොල්ශෙවික් සම්ප්‍රදායන් තුලින් ස්ටැලින්වාදයට එරෙහි විප්ලවවාදී සමාජවාදී විකල්පයක් සෙවීමට ප්‍රයත්න දැරූ රුසියානු අධ්‍යාපනඥ වාඩිම් රොගෝවින් වැනි අයට මුහුනපාන්නට වූයේ අහිතකර බුද්ධිමය වාතාවරනය දීර්ඝ කාලීනව පාලනයකට ය.

ට්‍රොට්ස්කි කෙරේ ශාස්ත්‍රීය ප්‍රවිෂ්ටයට අදාල සකල ගැටලුවක්ම පසුගිය තිස් අවුරුද්දක දේශපාලන වටපිටාවෙන් පමනක් ගලාඑන්නේ නොවේ. මෙම තත්වය උද්ගත කලාවූ වෙනත් දීර්ඝකාලීන බුද්ධිමය ප්‍රවනතා ද ඇත්තේමය. මෙය, බ්‍රිතාන්‍ය තුල මාග්‍රට් තැචර්ගේ ද එක්සත් ජනපදයේ රොනල්ඩ් රේගන්ගේ ද මැතිවරන ජයග්‍රහනවලට පෙර කාලපරිච්ඡේදය කරාම දිවෙයි. මා මෙහිලා සඳහන් කරන්නේ, දශක ගනනාවක් තිස්සේ දිග්ගැස්සුනු ක්‍රියාවලියක් ගැනයි. එය වනාහී ලියොන් ට්‍රොට්ස්කි තම විශිෂ්ටතම සහ සහතිකෙන්ම අන්තිම නියෝජිතයා කොට ගත් ''සම්භාව්‍ය මාක්ස්වාදයේ'' න්‍යායික ආශ්‍රය රාමුව සහ දේශපාලන දැක්ම කෙරෙන් වාම බුද්ධිමතුන් සැලකිය යුතු කොටසක් එන්න එන්ම වැඩිවැඩියෙන් වියෝවූ කාල පරිච්චේදයකි.

ට්‍රොට්ස්කිගේ දාර්ශනික ලෝක දෘෂ්ටිය මෙන්ම දේශපාලන හා මානව සංස්කෘතිය පිලිබඳ ඔහුගේ සංකල්ප විවරනයට අවස්ථාව මෙය නොවේ. දාර්ශනික භෞතිකවාදය කෙරේ අශාම්‍ය කැපවීම ද ඓතිහාසික ක්‍රියාදාමයේ නියාම පාලිත ගති ලක්ෂන ගැන විශ්වාසය ද මානව තර්ක බුද්ධියේ (මෙම මානව ඓන්ද්‍රිය ගුනය භෞතිකවාදීව වටහා ගන්නාතාක් දුරට) බලය සහ වෛෂයික සත්‍යය සොයාගැනීමට එයට ඇති හැකියාව පිලිබඳ විශ්වාසය සහ එය හා බැඳුනු විද්‍යාවේ ප්‍රගතිශීලී භුමිකාව ගැන විශ්වාසය ද මෙම ලෝක දෘෂ්ටියේ තීරනාත්මක අංගයන් බව අප මෙහිදී ගොඩනගන තර්කයේ අත්‍යවශ්‍ය පුරුකක් ලෙස මෙහි ලා සඳහන් කල යුතුව ඇත. නීර්නකවාදියෙක්, ශුභවාදියෙක්, සහ ජාත්‍යන්තරවාදියෙක් වූ ට්‍රොට්ස්කි, ලෝක සමාජවාදී විප්ලවය අනිවාර්යෙන්ම ලෝක ධනවාදී පද්ධතියේ විසඳිය නොහැකි ප්‍රතිසතිතා තුලින් පැන නැගෙන බව ඒත්තු ගත්තේය. අන් සියල්ලටමත් වඩා ඔහු අවධාරනය කලේ ධනවාදී පද්ධතිය පෙරලා සමාජවාදයට පදනම දැමිය හැකි විප්ලවවාදී බලවේගයක්, එනම් කම්කරු පන්තිය සමාජය තුලම පවතින බව ය.

සම්භාව්‍ය මාක්ස්වාදී දෘෂ්ඨියේ මෙම මූලිකාංග කිසිවක්, අන් සියල්ලටත් වඩා එහි ශුභවාදය කිසිදු සැලකිය යුතු වාම බුද්ධිමතුන් කොටසක් තුල ඉතුරුවී නොමැත. 1920 වන විට පවා, ප්‍රථම ලෝක සංග්‍රාමයේ විනාශකාරී පහර, දෙවන ජාත්‍යන්තරයේ බිඳවැටීම, සහ ඉන් ටික කලකට පසු ඔක්තෝබර් විප්ලවයෙන් ඉක්බිත්තේ මධ්‍යම හා බටහිර යුරෝපයේ කම්කරු පන්තිය අත්පත් කරගත් දේශපාලන පරාජයන්, වාම සුලු ධනේශ්වර බුද්ධිමතුන් සැලකිය යුතු කොටසකගේ මාක්ස්වාදී දෘෂ්ටියට යටින් වලකැපීය. 1926 තරම් ඈත සමයක *The Psychology of Socialism*, (සමාජවාදයේ මානෝගතිය) යන කෘතියෙන් හෙන්ඩ්‍රික් ඩි මෑන් විසින් මාක්ස්වාදයට එල්ල කරනලද ප්‍රහාරය දේශපාලන විඥානයේ වර්ධනය පිලිබඳ භෞතිකවාදී අර්ථ කථනය සහ මාක්ස්වාදී දේශපාලන භාවිතයේ සඵලත්වය ගැන වාම බුද්ධිමතුන් අතර වැඩෙමින පැවති, සංශයවාදයට හඬක් ලබා දුන්නේය. කම්කරු පන්ති ජන සමූහයේ විඥානය මත වෛෂයික සමාජ ආර්ථික ක්‍රියාදාමයේ විප්ලවවාදී බලපෑම පිලිබඳ මාක්ස්වාදයේ විශ්වාසය අස්ථානගතවී ඇතැයි ඩි මෑන් තර්ක කලේය. වෛෂයික පන්ති අවශ්‍යතාවන්ට මාක්ස්වාදීන් තර්කානුකූලව යොමුකල ආයාචනා කම්කරු පන්තිය සමාජවාදයට දිනාගැනීමට ප්‍රමානවත් නැතැයි ඩි මෑන් ඉදිරිපත් කල තර්කවලින් බොහොමයක් පසුකාලයකදී ෆ්‍රෑන්ක්ෆර්ට් ගුරුකුලයේ න්‍යායවාදීන්ගේ ලේඛන තුලට ඇතුලු විය.

1933 හිට්ලර් ජයගැනීම, මොස්කව් නඩුවිභාග, ස්පාඤ්ඤ සිවිල් යුද්ධයේ පරාජය හා අවසානයේදී ඇතිකරගත් ස්ටැලින්-හිට්ලර් ගිවිසුම වාම බුද්ධිමතුන්ගේ දේශපාලන දිරිය මුලුමනින්ම සිඳලීය. සමාජවාදයේ මූලික පර්යාලෝකය අවලංගුව ඇතැයි ඔවුහු විශ්වාස කලහ. කම්කරු පන්තිය අසමර්ථ වී තිබුනි. සමකාලීන සමාජයතුල විප්ලවවාදී කර්තෘ කෙනෙක් පවත්නේ නැත. ට්‍රොට්ස්කි ඔහුගේ අවසාන රචනාවක එවැනි තර්කයන්ගේ ගම්‍යය පැහැදිලි කලේය. "පරාජයේ හේතුව නිර්ධන පන්තියේම සමාජ ගතිස්වභාවය තුල මුල්බැස ඇතැයි යන්න සත්‍ය යයි පිලිගන්නේ නම් නූතන සමාජයේ තත්වය අපේක්ෂා භංග යැයි පිලිගත්තා වනු ඇත.(11) එයින් යන්තම් සත් වසරකට පසුව හෝකයිමර් හා ඇඩෝනෝ තම *Dialectic of the Enlightenment* (බුද්ධි ප්‍රබෝධයේ අපෝහකය) නම් කෘතිය තුලින් නිශ්චිතවම මේ නිගමනයට ලගාවූහ.

විසිවන සියවසේ ඛේදවාචකයන් විසින් බුද්ධිමත් පන්තිය අබිබවා හා ක්ෂයකර දමා ඇතැයි පැවසීම අතිශයෝක්තියක් නොවේ. ලෝක යුද්ධ දෙකක්, ෆැසිස්ට්වාදය, ස්ටැලින්වාදීන් සමාජවාදය පාවාදීම හා

නිලධරයේ දැඩි බරින් ඇතිකල කම්කරු පන්තියේ පක්ෂාඝාතය දැන් අසාරදර්ශනය ඉක්මවා නරුමත්වය හා අලසකමට දොර හැරදී තිබේ. පරස්වාවකව, බුද්ධිමය දිරිසුන්කම ජයගැනීමට අතීත පරාජයන්ගේ හේතු සොයන ක්‍රමානුකුල අධ්‍යයනයක් අවශ්‍යව තුබුනු අතර අනෙක් අතට ඒ සඳහා ට්‍රොට්ස්කිගේ හා සම්භාව්‍ය මාක්ස්වාදයේ මහා ගුරුකුලයෙහි අදහස් හා නිරතවීම අත්‍යවශ්‍යය. එහෙත්, පශ්චාත් දෙවන ලෝක යුද්ධ ධනේශ්වර ආර්ථික ප්‍රසාරනය මත පදනම්වූ වෛෂයික තත්වය එවැනි තීරනයකට එරෙහිව ක්‍රියාකලේය. දැන් ඉතින් ට්‍රොට්ස්කිගේ මතවල යලි නිරත වීමක් සඳහා පවත්නා ඉදිරිදර්ශනයන් මොනවා ද? මෙම ප්‍රශ්නයට පිලිතුරු වශයෙන් ට්‍රොට්ස්කි යොදාගත් ප්‍රවේශය ම යොදාගැනීම යෝග්‍ය යයි මම සිතමි. ඔහුගේම ජීවිතයේ රියසක රුසියාව තුල ද යුරෝපයේ හා සමස්තයක් ලෙස ලෝකය පුරා ද සමාජවාදී විප්ලවයේ වර්ධනයෙහි සන්දර්භය තුල වටහාගත යුතුය යන්න ඔහු අවධාරනය කලේය. පෞද්ගලික ඛේදාන්තයන් නැති බවත්, ඒ වෙනුවට ඇත්තේ ලෝක සමාජවාදී විප්ලවයේ පරස්පර විරෝධී විකාශනයේ විවිධ අදියරයන් බවත් තමන්ගේම ජීවිතයේ දෝලනය අගයමින්, ට්‍රොට්ස්කි ප්‍රකාශ කලේය. විප්ලවවාදී රල පහරේ වඩදිය ඔහු බලයට පත් කලේය. එහි බාදිය ඔහු පිටුවහලට ඇද දැමීය.

මාක්ස්වාදය, ට්‍රොට්ස්කි එම යෙදුම වටහාගෙන තිබුනු ආකාරයට, කම්කරු පන්තියේ ජීවිතය තුල වැදගත් කාර්යභාරයක් ඉටුකලායින් පසුව දශක ගනනාවක් ගෙවීගොස් තිබේ. එම දශක වනාහි ධනේශ්වර ආර්ථික ස්ථාවරත්වයේ හා සැලකිය යුතු වර්ධනයක අවධියකි. පන්ති අරගලය යම්තාක් දුරට ප්‍රකාශිත වී නම් එය කම්කරු නිලධරයේ පොලිස් පරීක්ෂාව යටතේ සම්ප්‍රදායානුකුල මාර්ග තුල සිරකර දමන ලදී. දැන්, කෙසේ වෙතත් ස්පාඤ්ඤ ඉතිහාසය, තරමක් හදිස්සියේම වාගේ එහි විශ්මයජනක එක්තරා හැරීමක් ගෙන ඇති බව පෙනී යයි. අප රැස්ව සිටින අද දින ලෝකය අප ගිය වසරේ නිව් ඔර්ලියන්ස්හිදී රැස්වූ අවස්ථාවේ ලෝකයට වඩා බෙහෙවින් වෙනස් බව දිස්වෙයි. පසුගිය සති කීපය පුරා 1930 ගනන්වල මහා අවපාතය ගැන සඳහන් කිරීම සාමාන්‍ය දෙයක් වී ඇත. දරනහරින අර්බුදය ඇමරිකානු හා ලෝක ධනවාදය බිඳවැටීමේ අද්දරට ගෙනැවිත් තිබේ යයි එක්සත් ජනපදයේ ජනාධිපති පවා අද පිලිගනියි.

මෙම අර්බුදය වනාහි "ධනවාදයේ මරලතෝනිය" යන වාක්‍යාංශය නිර්මානය කල ලියොන් ට්‍රොට්ස්කි හොඳින්ම වටහාගෙන තිබුනු අර්බුදයක් බව වටහාගැනීම අපහසු නැත. මාක්ස්වාදයේ බොහෝ විරුද්ධවාදීන් විසින් සිනහවට ලක් කෙරුනු පැරනි "මහා ව්‍යසනයේ" න්‍යාය, විහිලුවක් හෝ මෙලෝ නැති දෙයක් යයි තවදුරටත් පෙනීයන්නේ නැත.

අවසාන විග්‍රහයේදී, සමාජ පැවැත්ම විසින් සමාජ විඥානය නීර්නය කරන්නේමය. එවිට මා සැක කරන්නේ ගැඹුරුවන්නාවූ අර්බුදය, යල්පැනගිය සහ අවලංගු වූ උපකල්පනයන් යලි සලකා බැලීමට සිදු කරන්නේ නම් ලියොන් ට්‍රොට්ස්කිගේ ජීවිතය හා කාර්ය සාධනය පිලිබඳව දෘඪ අධ්‍යයනාත්මක ආසක්තතාව පුනර්ජීවනය වනු අපට ඉක්මනින්ම දැකගත හැකිය යන්න ය.

**සටහන්**


**1.** අයිසැක් ඩොයිස්චර්, The *Prophet Unarmed නිරායුධ අනාගත වක්තෘ* (ලන්ඩන්: වර්සෝ, 2003) පි. vii.

**2.** බරක් නේයි පැෂ්, The *Social and Political Thought of Leon Trotsky,* ලියොන් ට්‍රොට්ස්කිගේ සමාජ හා දේශපාලන චින්තනය (ඔක්ස්ෆර්ඩ්: ඔක්සෆර්ඩ් යුනිවර්සිටි ප්‍රෙස්, 1978), පි. viii.

**3.** එම. 11පි.

**4.** එම. 13 පි.

**5.** ඩේවිඩ් නෝර්ත්, *ලියොන් ට්‍රොට්ස්කි හා ඓතිහාසික මුසාකරනයේ පශ්චාත් සෝවියට් ගුරු කුලය* (කම්කරු මාවත ප්‍රකාශන)

**6.** ස්ටෙෆන් කොට්කින්: *Magnetic Mountain* අයස්කාන්ත පර්වතය, (බර්ක්ලේ: යුනිවර්සිටි ඔෆ් කැලිෆෝනියා ප්‍රෙස්, 1985), 364 පි.

**7.** රොබට් ඩබ්. තර්ස්ටන් :*Life and Terror in Stalin's Russia 1934-1941*, 1934-1941 ස්ටැලින් රුසියාවේ ජීවිතය හා භීෂනය, පි. 9.

**8.** එම 26-27 පි.

**9.** වික්ටර් සර්ජ්: *From Lenin to Stalin ලෙනින්ගේ සිට ස්ටැලින් දක්වා* (නිව් යෝර්ක්: පාර්ත්ෆයින්ඩර් 1973), 109 පි.

**10.** වෝල්ටර් බෙන්ජමින්: *Selected Writings, තෝරාගත් ලිපි, වෙලුම 2: 1927-1934* (කේම්බ්‍රිජ්, එම්ඒ: බෙල්ක්නැප් ප්‍රෙස්, 1999), 477 පි.

**11.** ලියොන් ට්‍රොට්ස්කි: *මාක්ස්වාදයේ ආරක්ෂාව සඳහා* කෘතියෙහි "යුද්ධය තුල සෝවියට් සංගමය", නැමැති ලිපිය. 15 පි.


© www.wsws.org